ඇතැම් මාධ්‍ය මගින්, ශිෂ්ට සම්පන්න සමාජ චින්තනයකට දායකත්වයක් ලබාදීම සඳහා ශිෂ්ට සම්පන්න භාෂාවක් භාවිතා කිරීම සඳහා මාධ්‍ය අත රැඳි වගකීම නොතකමින් භාවිත කරනා ඇතැම් යෙදුම් තිබේ. මෙම යෙදුම් ඔස්සේ සමාජයේ යම් යම් කොටස් අගතියට ලක් වීම, කොන් කිරීමකට ලක් වීම සිදුවිය හැක. උදාහරණයක් ලෙසින් "මත් ලෝලීන්" වැනි යෙදුමක් දැක්විය හැක. මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක් පවතින හෙයින්, එය හුදු මත්ද්‍රව්‍ය සඳහා ලෝලත්වයක් බවට ලඝු කිරීම නිවැරදි දැයි මෙහිදී විමසිය යුතු වේ.

මව්බිම පුවත්පතේ නොවැම්බර් 25 සහ 26 දෙදින තුළ පළවූ, එකිනෙකට සම්බන්ධිත පුවත් සිදුවීමක වාර්තාවන් දෙක සලකා බලමු. එම එක් පුවත් වාර්තාවක "මත් ලෝලියා" යනුවෙන් සඳහන් වන අතර, අනෙක් පුවත් වාර්තාවේ වඩාත් නිවැරදි අයුරින් "මතට ඇබ්බැහි වූවන්" ලෙසින් සඳහන් වේ. එසේ නම්, වඩාත් යෝග්‍ය ප්‍රවේශය වන්නේ මෙවැනි සියලුම පුවත් වාර්තාවන් සඳහා වඩාත් නිවැරදි "මතට ඇබ්බැහි වූවන්" වැනි යෙදුම් භාවිතා කිරීමේ පරිචයක් ඇති කර ගැනීම නොවේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima